සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 43 | S | I |
|---|---|---|---|---|

**චිත්‍ර කලාව** — **කාලය පැය එකයි**

**සැලකිය යුතුයි :- ●සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

● **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට හිස්තැන් පුරවන්න.**



01. මෙහි දක්වෙනුයේ ශ්‍රී ලාංකික ගල් කැටයම් අතර අභ්‍යන්තරයට කපා හාර සකස් කරන ලද පළමු විශාල ගුහාව වන ................................................ ගුහාවේ හිඳි පිළිමයයි.

02. මෙය ................................................................ ශිල්ප ක්‍රමයට තෙලන ලද ශෛලමය ප්‍රතිමාවකි.

03. ගුහාව මධ්‍යයේ වජ්‍ර සංකේත හා සිංහ රූප කැටයම් සහිත ...................................................................... මත ධ්‍යානි මුද්‍රාවෙන් බුදුන් වහන්සේ වැඩ සිටී.

04. ප්‍රතිමාව පිටුපස තොරණකි. පසුපස ඉහළින් ඇති දේවතා රූප වලින් ...................................................................... යන දෙවිවරුන් නිරූපණය කරන අතර පිළිමය දෙපසත් චාමරධාරී රූප දක්වා ඇත.

05. ප්‍රතිමාවේ පිළිබිඹු වන නිර්මාණ අංග මතින් ................................................................... සංකල්පය මතු කිරීමට උත්සහ දරන බව විද්වත් මතයයි.

★ **අංක 06 සිට 10 තෙක් දි ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

06. අනුරාධපුර අභයගිරි විහාර භූමියෙන් හමුවන ධ්‍යාන මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමාව කුමක් ද?

..........................................................................

07. "ඇතා වල්ලිව එළවාගෙන යාම" යන සිතුවමහි නිර්මාණ ශිල්පියා කවුරුන්ද ? ..........................................................

08. වර්ණ සිතුවමක දුර- ලග දක්වීමේ දී යොදාගනු ලබන ශිල්පීය ක්‍රමය කුමන නමකින් හැඳින්වේ ද?

..........................................................................

09. සුමන දිසානායක සහ වෛතීස්වරම් සිව සුබ්‍රමනියම් යන ශිල්පීන් වඩාත් සුප්‍රසිද්ධිය උසුලන්නේ කුමන ආරක චිත්‍ර කලාවක් සඳහා ද? ..........................................................................

10. සිස්ටයින් දෙව්මැදුරේ ඇති ලොව විශාලතම ෆ්‍රෙස්කෝ සිතුවමේ නම කුමක් ද? .........................................................

★ අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

11. පොළොන්නරුවේ කෝවිල් ආශ්‍රිතව හමු වූ බොහෝ ප්‍රතිමා
1. පොළොන්නරු යුගයේ ලෝහ තාක්ෂණයේ නිපුණත්වයට කදිම උදාහරණයෝය.
2. ආගමික භක්තිය සහ තාක්ෂණික හැකියාවන් නිරූපණය කරන නිර්මාණයෝ ය.
3. පද්ම පීඨයක් මත පිහිටුවන ලද පූර්ණ උන්නත ලෝහ පිළිම වේ.
4. පොළොන්නරු යුගයෙන් හමුවන හින්දු ආගමික භක්තිය නිරූපිත ලෝකඩ ප්‍රතිමා වේ.

12. පැබ්ලෝ පිකාසෝගේ "ඇවිග්නෝන්හි යුවතියෝ" චිත්‍රයෙන් ප්‍රකාශ වනුයේ,
1. භාවාත්මක අරුතින් හැඟීම් ප්‍රකාශ කළ හැකි අයුරුයි.
2. සංකේත භාවිතය තුළින් හැඟීම් ප්‍රකාශ කළ හැකි අයුරුයි.
3. ජ්‍යාමිතික හැඩතල තුළින් භාවමය හැඟීම් ප්‍රකාශ කළ හැකි බවය.
4. ජ්‍යාමිතික හැඩතල ස්වභාවිකත්ව හැඩයනට වඩා ප්‍රබල බවයි.

13. කොළඹ කෞතුකාගාරයේ දක්නට ලැබෙන තොලුවිල බුදු පිළිමය,
1. ගුප්ත සම්ප්‍රදායේ ලක්ෂණ ප්‍රකාශ කරන බව විද්වත් මතයයි.
2. ධ්‍යානි මුද්‍රාවෙන් යුතු අනුරාධපුර යුගයට අයත් පිළිමයකි.
3. බුදුන් වහන්සේගේ මහා පෞරුෂය දක්වන පිළිමයකි.
4. ඇඟට ඇලුන චීවරය සහිත පිළිමයකි.

14. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ගුහා සිතුවම් වලට වඩා යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ලෙන් සිතුවම්
1. වර්ණ වැඩි වශයෙන් භාවිතයෙන් නිර්මාණය කර ඇත.
2. උසින් වැඩි අඳුරු ලෙන් තුළ සිතුවම් කර ඇත.
3. සත්ත්ව රූප පමණක් සිතුවම් කර ඇත.
4. තාත්විකත්වයට සමීපව සිතුවම් කර ඇත.

15. පෝස්ටර් නිර්මාණයන් අයත් වන්නේ
1. පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනයටය.
2. නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් නිර්මාණ වලටය.
3. පාරිභාරික අවශ්‍යතා සඳහා සැරසිලි නිර්මාණ වලටය.
4. පරිසරයේ පවත්නා ද්‍රව්‍ය සම්පිණ්ඩනාත්මකව චිත්‍රණය කිරීමට.

★ ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

16. නන්දි - ....................................................................................................................................

17. ක්ෂය වෘද්ධි ලක්ෂණ - ....................................................................................................................................

18. හර්මිකාව - ....................................................................................................................................

19. ඇත්කඳලිහිණියා - ....................................................................................................................................

20. නියඳ කෙඳි - ....................................................................................................................................

★ ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන් වලට කිසියම් සබඳතාවයක් දක්වන රූප සටහන් ඉදිරියෙන් ඇති ABCDE යන ඒවා අතරින් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

21.  ( ......................)

 A

22.  ( ......................)

 B


23.  ( ......................)

 C

24.  ( ......................)

 D

25.  ( ......................)

 E

★ අංක 26 සිට 30 තෙක් එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය / වචන යොදා සම්පූර්ණ කරන්න.

26. පොළොන්නරුව වටදාගෙය නිශ්ශංකමල්ල රජතුමාගේ නිර්මාණයක් ලෙස දළඳා මළුව පිහිටි ............................................................. නම් සෙල් ලිපියට අනුව සළකයි.

27. ඊජිප්තු සිතුවමක් වන කුරුලු දඩයම තිබ්ස්වල ........................................................ සොහොන් ගැබකින් හමු වී ඇත.

28. iv වන බුවනෙකබාහු රජතුමා විසින් ........................................................ හිමිපාණන් වහන්සේගේ අනුසාසනාව පරිදි සද්ධර්මතිලක විහාරය ඉදිකරන ලදී.


29. දුෂ්කර ක්‍රියාව නැමැති ........................................................ සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමාව ඉන්දියානු මූර්ති අතර ඇති විශිෂ්ට නිර්මාණයකි.

30. ඉසුරුමුණි විහාරයේ නිර්මාණය කර ඇති ඇත් රූප ඉන්දියානු පල්ලව කලා සම්ප්‍රදායට අයත් මහබලිපුමේහි .

.................................................... කැටයම් ඇත් රූප වලට සමාන ලක්ෂණ පෙන්නුම් කරන බව විචාරක මතයයි.

★ ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් දී ඇති **F G H I J** යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන උන්නත කැටයම සඳහා තේමාව වී ඇත්තේ ........................................................... නමින්ය.

32. G අක්ෂරයෙන් දැක්වෙන පිළිරුව ........................................................... නම් මූර්ති ශිල්පියාගේ නිර්මාණයකි.

33. H අක්ෂරයෙන් දැක්වෙන ................................................................. පාෂාණයෙන් නිර්මිත ස්පීනික්ස් නම් මූර්තියෙන් පාරාවරුන්ගේ තෙද බල පරාක්‍රමය කියාපායි.

34. I අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය සාතවාහන යුගයට අයත් සාංචි තොරණේ දැකිය හැකි ...................................................................... තේමාව වූ පනෙල් කැටයමකි.

35. J අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය ........................................................... යුගයට අයත්ය.

★ ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 දක්වා දී ඇති උප මාතෘකා වලට අදාළව අර්ථවත් වාක්‍ය බැගින් ලියන්න.



36. ස්ථානය - ..........................................................................................................................

37. තේමාව - ..........................................................................................................................

38. ශිල්පියා - ..........................................................................................................................

39. ශෛලිය - ..........................................................................................................................

40. ශිල්පීය කුසලතා - ..........................................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**11 ශ්‍රේණිය** අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 **43 S II**

**චිත්‍ර කලාව** **කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :-** ★ ඔබේ විභාග අංකය උත්තර පත්‍රයේ පැහැදිලිව ලියන්න.
★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතුය. තෙත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
★ දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන වර්ණ මාධ්‍යයන් හෝ භාවිත කළ හැකිය.

**නිදහස් රේඛාමය ඇඳීම සහ වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට
1. රේඛා මඟින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍යය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

★ මෙම චිත්‍ර දෙකම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
★ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

<u>රේඛා චිත්‍රය</u>
1. පූර්ව අධ්‍යයනයේ දී ඔබ දක්වා ඇති කුසලතා

<u>වර්ණ චිත්‍ර</u>
02. ද්‍රව්‍ය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
03. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
04. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හෝ ගති ලක්ෂණ දැක්වීම.
05. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
06. උචිත පසුබිමක් යෙදීම සහ සමස්ත නිමාව.

**සැලකිය යුතුයි:**
ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ල පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 **43 S III**

**චිත්‍ර කලාව** **කාලය පැය දෙකයි**

සැලකිය යුතුයි :- ★ ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
★ ඔබේ විභාග අංකය සහ ප්‍රශ්න අංකය පැහැදිලිව සඳහන් කරන්න.
★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතුය. තෙත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
★ දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන වර්ණ මාධ්‍යයන් හෝ භාවිතා කළ හැකිය.

"අ" කොටසින් හෝ "ආ" කොටසින් හෝ "ඉ" කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.

### "අ" කොටස - චිත්‍ර සංරචනය

1. අස්වැන්න නෙලනා ගොවි ගෙවිලියෝ
2. ආගමික සිද්ධස්ථානයක බැතිමතුන්
3. සොඳුරු වන බිමක සැරිසරන වන සතුන්
4. මාර්ග රිය අනතුරක්

### "ආ" කොටස - මෝස්තර නිර්මාණය

04. පාරම්පරික මෝස්තර සැරසිලි ඇසුරු කර ගනිමින් ඕවලාකාර පිත්තල බන්දේසියක් සඳහා මෝස්තරයක් නිර්මාණය කොට මාධ්‍යයේ ස්වභාවය රැකෙන පරිදි වර්ණ ගන්වන්න.

05. ගවුම් රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක අඟල් 9x9 ප්‍රමාණයේ කොටසක් නිර්මාණාත්මක මලක් සහ කොළයක් ඇසුරෙන් නිර්මාණය කරන්න.

06. අඟල් 10 ක් (25cm) උස මැටි බඳුනක් ඇඳ සැරසිලි මෝස්තර යොදා අලංකාර කරන්න.

### "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

07. "මත්ද්‍රව්‍යය භාවිතය ජීවිත විනාශ කරලයි" තේමාව යටතේ පෝස්ටර් චිත්‍රයක් අඳින්න. අභිමත වදනක් ඇතුළත් කළ හැකිය.

08. "උඩරට සම්ප්‍රදායේ සිතුවම් කලාව" නමැති පොතට සුදුසු පිටකවරයක් අඳින්න.

09. ඔබේ පාසල් කලා උළෙල සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් සැලසුම් කරන්න.

## තෙවන වාර පරීක්ෂණය - 2019

චිත්‍ර කලාව


11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

1 - විද්‍යාධර
2 - පූර්න උන්නත
3 - වජ්‍රාසන
4 - බ්‍රහ්ම සහ විෂ්ණු
5 - මහායාන
6 - සමාධි
7 - පෙරියතම්බි සුබ්‍රමනියම්
8 - වර්ණ පර්යාවලෝකනය
9 - සන්නිදර්ශන චිත්‍ර
10 - අවසන් විනිශ්චය
11 - 3
12 - 3
13 - 2
14 - 4
15 - 2
21 - B
22 - C
23 - D
24 - E
25 - A
26 - ගල්පොත
27 - නෛබාමුන්
28 - ධම්මකිත්ති
29 - ගන්ධාර
30 - අකාශ ගංගාව රෝහණය
31 - ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ආරම්භය සහ විකාශනය
32 - ඇලැක්සැන්ඩ්‍රෝස්
33 - ග්‍රැනයිට්
34 - බුදුන්වහන්සේ සංකස්සපුරයට වැඩම කිරීම.
35 - පුනර්ජීවන / පුබුදු

16. හින්දු ආගමේ ගවයව මේ නමින් හඳුන්වයි.
17. ඉදිරියට දැක්වීමේ දී කෙටි වී පෙන්වීමය.
18. ඉන්දියාවේ සාංචි ස්ථූපයේ ගර්භයට ඉහළින් ඇති ගරාදි වැට සහිත කොටස මේ නමින් හඳුන්වයි.
19. පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර අතර සත්ත්ව කොටසේ නිර්ජීව ගණයට ඇතුළත් වන ඇත්, හිසක් සහ ලිහිණියෙකුගේ ශරීරයක් සහිත මෝස්තරයකි.
20. පාරම්පරික පැදුරු කර්මාන්තයේ දී පන් හෙවත් නියඳි වලින් ලබාගන්නා කෙඳිය
36. මෙය කතලුව විහාරයේ දැකිය හැකි සිතුවමකි.
37. මෙයින් මහධන සිටුවරයාගේ නිවසේ පැවැති නැටුම් සහ නැටුමේ සංදර්ශන අවස්ථාවක් නිරූපණය කෙරේ.
38. කඩොල්ලගල්ලේ මහා සිත්තරා හා පොඩ්ඩ සිත්තරා යන ශිල්පීන් මෙහි නිර්මාණ කටයුතු කර ඇත.
39. මහනුවර යුගයේ පහතරට ශෛලියට අනුව සිතුවම් කර ඇත
40. සියුම් රේඛා භාවිතය, සියුම්ව ත්‍රිමාණ ලක්ෂණ යෙදීම, පාරිභාරක භාණ්ඩ විලාසිතා යොදා ගැනීම, ත්‍රිමාණ ලක්ෂණ දනවමින් අවස්ථාව නිරූපණය සහ මනා සම්පිණ්ඩණය



**<u>යෝජිත ද්‍රව්‍ය</u>**

1. පෙට්ටියක් (20cm x 15 cm x 10 cm) පමණ පෙට්ටියක් සුදු කඩදාසියකින් ආවරණය කරන්න)
2. කොටු සහිත නැප්කිනියක් (ප්‍රමාණය 45cm x 45 cm පමණ)
3. වීදුරුවක් - වර්ණවත් ජලය අඩක් පුරවන ලද (12 cm පමණ උස)
4. කුඩා ප්‍රමාණයේ මැටි කලයක් (මධ්‍ය විෂ්කම්භය 20 cm පමණ)
5. ක්‍රෝටන් අත්තක් (තරමක් දිග පළල් 4/5 පමණ වූ)
6. ආධාරකයක්